# අනුරාධපුර යුගයේ විහාරාරාම ආශ්‍රිත ව පැවති සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියෙහි ස්වරූපය පිළිබඳ විමසුමක්

# [An Investigation on the Nature of the Classical Education Process in Anuradhaura Era Associated with Monasteries]

**Kelegama Jinarathana**[1]

**Abstract**

Monastery education played a pivotal role in shaping the intellectual and cultural landscape of ancient Sri Lanka. This research paper explores the rich tapestry of educational practices within monastic institutions, focusing on their profound impact on societal development and the preservation of knowledge. Rooted in Theravada Buddhism, monasteries served as centers of learning, nurturing a holistic approach to education that encompassed religious teachings, philosophy, literature, and various religious and social practical skills. The monastic education system in ancient Sri Lanka was characterized by a rigorous curriculum, with an emphasis on memorization, oral transmission, documentation and critical thinking. Monks, revered as scholars and educators, played a dual role as spiritual guides and custodians of knowledge. The monastic universities, such as Mahavihara and Abhayagiri, attracted scholars from across the Indian subcontinent, fostering a vibrant exchange of ideas and contributing to the dissemination of diverse intellectual traditions. Moreover, monastery education played a crucial role in the preservation of ancient texts, including the Pali Canon and commentaries, ensuring the continuity of Sri Lanka's cultural and religious heritage. The impact of monastery education extended beyond religious boundaries, influencing art, literature, and governance. By examining the dynamic interplay between monastic education and societal evolution, this abstract seeks to illuminate the profound and lasting legacy of ancient Sri Lanka's monastery-based educational system.

**Key Words:** Ancient monanstery, Anuradhaura Era, Education, Heritage.

1. Senior Lecturer, Department of Social Sciences and Comparative studies, Bhiksu University of Sri Lanka.
E-mail: jinarathana@busl.ac.lk https://orcid.org/0000-0002-1106-8380

Received: 6 March 2024, Accepted revised version: 20 June 2024. This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## සාරසංක්ෂේපය

ක්‍රි:පූ 6 වන සියවසේ දී පමණ ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සංක්‍රමණිකයෙකු වන විජය රජුගේ ඇමතිවරයෙකු වූ අනුරාධ ඇමතිවරයා විසින් එවක කදම්භනදී යනුවෙන් හඳුන්වන ලද වත්මන් මල්වතු ඔය ඉවුරෙහි අනුරාධගාම යන නමින් ජනපදයක් ආරම්භකොට ඇත. මෙම ජනපදය පසු අවධියක දී එනම් පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ අගනගරය බවට පත් ව ඇත. ඓතිහාසික මූලාශ්‍රය දක්වන පරිදි ක්‍රි:පූ: 3 වන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙරටට බුදු දහම හඳුන්වාදීමත් සමඟ අනුරාධපුර නගරය කේන්ද්‍ර කොටගෙන ඇරඹි බෞද්ධ සංඝාරාම පද්ධතිය කාලයත් සමඟ විවිධ මුහුණුවර ගනිමින්, විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් මෙරට බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත විය. එලෙස ව්‍යාප්ත වූ මෙම සංඝාරාම පද්ධතිය ඇසුරෙහි මෙරට පැරණි අධ්‍යාපන ක්‍රියාවලිය හැදී වැඩී පෝෂණය වී ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් මූලික ව අවධානය යොමුකොට ඇත්තේ වෙළෙඳපොළ ඉලක්ක කොටගත් අධ්‍යාපන ක්‍රියාදාමයකට ය. මෙම ක්‍රියාදාමය නිසා සමාජීය හා සංස්කෘතික වශයෙන් පරිහානියක් සමාජයේ දිස් වේ. එසේ වුව ද මෙරට අධ්‍යාපන ක්‍රියාවලියෙහි ආරම්භය සිදු වූ අනුරාධපුර යුගයේ පැවති බෞද්ධ ආරාම පද්ධතිය ආශ්‍රිත ව පැවති සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියේ තත්කාලීන ව රටේ සංවර්ධනයට හා සමාජයෙහි යහපැවැත්ම ආරක්ෂා කරගත හැකි වන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දී ඇති බව නිරීක්ෂණය වෙයි. මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ වර්තමානය වනවිට නොසලකා හැර ඇති මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියෙහි ස්වභාවය පෙන්වා දී එය සමාජගත කිරීම හා එයින් අද්‍යතන අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා උකහාගත හැකි පාඩම් ඇසුරින් රටේ හා සමාජයෙහි යහපැවැත්ම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය අදාළ වන්නේ කෙසේ ද? යන්න පෙන්වා දීම ය. මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ක්‍රමවේදය වන්නේ පුස්තකාලය අධ්‍යයනය කේන්ද්‍රගත ව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ කරුණු විමර්ශනය කිරීම ය. මෙම අධ්‍යයනය පැතිකඩ කිහිපයකින් ම වැදගත්කමක් ගැබ් ව ඇති පර්යේෂණයකි. මෙරට සාම්ප්‍රදායික ආධ්‍යාපනික අස්පර්ශිත උරුමය පිළිබඳ දැනුවත් වීමට ඇති හැකියාව ඉන් එකකි. මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියේ ආරම්භය සිදු වූ අනුරාධපුර යුගයේ දී මෙරට පැවති අධ්‍යාපන ක්‍රියාවලියේ විවිධතා පිරික්සීමේ දී මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය ආදි විහාර සංකීර්ණ පදනම් කරගෙන ඇති වූ පිරිවෙන් ආශ්‍රිත ව එම අධ්‍යාපන ක්‍රියාවලිය සංවිධිත අයුරින් දීර්ඝ කාලයක් පුරාවට එනම් ක්‍රි:පූ තෙවන සියවසේ සිට ක්‍රි:ව එකළොස්වන සියවස දක්වා ම ක්‍රියාත්මක ව පැවති බවක් දැකිය හැකි ය. මෙම අධ්‍යාපන ක්‍රියාවලියේ පැවති විෂය නිර්දේශය ලෝකෝත්තර හා ලෞකික යන උභය ජීවිත සාර්ථක කරගැනීම සඳහා සම්මිශ්‍රණයකින් යුතු ව නිර්මාණය වී පැවති බැව් ඒ පිළිබඳ විමසීමේ දී පැහැදිලි ව පෙනීයයි. එම විෂයන් අධ්‍යාපන මධ්‍යස්ථානවල මෙන් ම පාරම්පරික ව සිය නිවෙස්වල ද ඉගෙනීමට අවකාශ තිබී ඇති බවක් පෙනේ.

**ප්‍රමුඛ පද:** අධ්‍යාපනය, අනුරාධපුර යුගය, උරුමය, පුරාණ ආරාම

## හැඳින්වීම

මහාවංසය නම් ප්‍රධාන ඓතිහාසික මූලාශ්‍රයගත තොරතුරුවල දැක්වෙන පරිදි ක්‍රි:පූ 6 වන සියවසේ දී පමණ ඉන්දියාවේ සිට මෙරටට පැමිණි සංක්‍රමණිකයෙකු වන විජය රජුගේ ඇමතිවරයෙකු වූ අනුරාධ ඇමතිවරයා විසින් එවක කදම්භනදී යනුවෙන් හඳුන්වන ලද වත්මන් මල්වතු ඔය ඉවුරෙහි අනුරාධගාම යන නමින් ජනපදයක් ආරම්භකොට ඇත. මෙම ජනපදය පසු

අවධියක දී එනම් පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ අගනගරය බවට පත් ව ඇත. එලෙස ක්‍රි:පූ: 4 වන සියවසේ දී පමණ මෙරට රාජ්‍යයේ අගනගරය බවට පත් මෙම නගරය ක්‍රිස්තු වර්ෂ 1017 දක්වා ම එනම් අනුරාධපුර රාජධානිය බිඳවැටී පොලොන්නරුව මෙරට රාජධානියේ අගනගරය බවට පත්වන තෙක් ම මෙරට අගනගරය වශයෙන් පැවත තිබී ඇත. වසර 1400 කට වැඩි මෙම සමස්ත කාලච්ඡේදයයේ සිටි විවිධ රජවරුන්ගේ අනුග්‍රහයෙන් මෙරට බොහෝ ප්‍රදේශවල බෞද්ධ සංඝාරාම විශාල වශයෙන් ඉදිවුණි. ඓතිහාසික මූලාශ්‍රය දක්වන පරිදි ක්‍රි:පූ 3 වන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙරටට බුදු දහම හඳුන්වාදීමත් සමඟ අනුරාධපුර නගරය කේන්ද්‍ර කොටගෙන ඇරඹි බෞද්ධ සංඝාරාම පද්ධතිය කාලයත් සමඟ විවිධ මුහුණුවර ගනිමින්, විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් මෙරට බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත විය. එලෙස ව්‍යාප්ත වූ මෙම සංඝාරාම පද්ධතිය ඇසුරෙහි මෙරට පැරණි අධ්‍යාපන ක්‍රියාවලිය හැදී වැඩී පෝෂණය වී ඇත. එම අධ්‍යාපන ක්‍රියාවලියේ පැවති සුවිශේෂී ලක්ෂණ නිසා ම එය වර්තමානයෙහි අධ්‍යාපන ක්‍රියාවලිය හා සම්බන්ධ පැරණි උරුමයක් වශයෙන් ද සැලකිය හැකි ව තිබේ. මෙම අධ්‍යයනයේ දී එම අධ්‍යාපන ක්‍රියාවලියෙහි පැවති සුවිශේෂී ලක්ෂණ පිළිබඳ ව විමසා බැලීමට අදහස් කෙරේ.

**පර්යේෂණ ගැටලුව**

වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් මූලික ව අවධානය යොමුකොට ඇත්තේ වෙළෙඳපොළ ඉලක්ක කොටගත් අධ්‍යාපන ක්‍රියාදාමයකට ය. මෙම කටයුත්ත නිසා සමාජීය හා සංස්කෘතික වශයෙන් පරිහාණියක් සමාජයේ දිස්වේ. එසේ වුව ද මෙරට අධ්‍යාපන ක්‍රියාවලියෙහි ආරම්භය සිදු වූ අනුරාධපුර යුගයේ පැවති බෞද්ධ ආරාම පද්ධතිය ආශ්‍රිත ව පැවති සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියේ දී තත්කාලීන ව රටේ සංවර්ධනයට හා සමාජයෙහි යහපැවැත්ම ආරක්ෂා කරගත හැකිවන ආකාරයේ අධ්‍යාපනයක් ලබා දී ඇති බව නිරීක්ෂණය වෙයි. මෙම අධ්‍යයනයෙහි ගැටලුව වන්නේ අනුරාධපුර යුගයේ දී පැවති අධ්‍යාපන ක්‍රියාවලියෙහි පැවති ස්වභාවය නොසලකා හැර නවමු අධ්‍යාපන ක්‍රම ගොඩනැඟීම නිසා සමාජීය වශයෙන් අත් ව ඇති යම් යම් පරිහානිය තත්ව මගහරවා ගැනීම සඳහා පැරණි සම්භාව්‍ය අධ්‍යාපන රටාවෙන් උගත හැකි පාඩම් නොසලකා හැර ඇත්තේ මන් ද යන්න ය.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ වර්තමානය වනවිට නොසලකා හැර ඇති මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියෙහි ස්වභාවය පෙන්වා දී එය සමාජගත කිරීම හා එයින් අද්‍යතන අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා උකහාගත හැකි පාඩම් ඇසුරින් රටේ හා සමාජයෙහි යහපැවැත්ම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය අදාළ වන්නේ කෙසේ ද යන්න පෙන්වා දීම ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ක්‍රමවේදය වන්නේ පුස්තකාල අධ්‍යයනය කේන්ද්‍රගත ව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ කරුණු විමර්ශනය කිරීම ය.

**පර්යේෂණයේ වැදගත්කම**

මෙම අධ්‍යයනය පැතිකඩ කිහිපයකින් ම වැදගත්කමක් ගැබ් ව ඇති පර්යේෂණයකි. ඉන් පළමු වැන්න මෙරට සාම්ප්‍රදායික අධ්‍යාපනික අස්පර්ශිත උරුමය පිළිබඳ දැනුවත් වීමට හැකියාව පැවතීම යි. අනුරාධපුර යුගයේ දී ආරම්භ වී මහනුවර යුගයේ දී ඉංග්‍රීසීන්ට මෙරට යටත් ව ඉංග්‍රීසීන් විසින් නව අධ්‍යාපන ක්‍රමවේද හඳුන්වා දීමේ අවස්ථාව දක්වා මෙරට පැවති

අධ්‍යාපන ක්‍රමවේදය මෙරට සම්භාව්‍ය අධ්‍යාපනික උරුමය වශයෙන් සලකනු ලැබේ. මෙම අධ්‍යයනයේ දී එම සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමයෙහි ආරම්භක කාලයෙහි පැවති ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලද හැකි ව තිබේ.

එසේ ම මෙම අධ්‍යයනයේ දී මෙරට සමභාව්‍ය ආධ්‍යාපනික ක්‍රමවේදයෙහි ස්වභාවය ආශ්‍රයෙන් වර්තමාන ආධ්‍යාපනික ක්‍රමවේද හැඩගස්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි වටිනාකම් පිළිබඳ අවබෝධයක් ද ලද හැකි ය. වර්තමානයේ දී මෙරට පවත්නා අධ්‍යාපන ක්‍රමවේදය හැඩගස්වාගෙන ඇත්තේ විදේශීය රටවල පවත්නා අධ්‍යාපන ක්‍රමවේද අනුව යමින් වෙළෙඳපොළ ඉලක්ක කරගත් ආධ්‍යාපනික ක්‍රමවේදයක් වශයෙනි. මෙහි අනිසි ඵලයක් වශයෙන් සාරධර්ම වියැකි සමාජයක් නිර්මාණය වී තිබේ. සමාජයෙහි යහපැවැත්ම තැනිය හැකිවන්නේ අධ්‍යාපන ක්‍රමවේද ඇසුරිනි. මෙම අධ්‍යයනයෙහි පවත්නා වැදගත්කම් අතර සාරධර්ම ආරක්‍ෂා වන සමාජයක් ගොඩගැනීමට අවැසි ආධ්‍යාපනික ක්‍රමයක අවශ්‍යතාව මතු කිරීම ද පෙන්වා දිය හැකි ය.

**සාකච්ඡාව**

අනුරාධපුර නගරයෙහි හා ආධ්‍යාපනික මධ්‍යස්ථාන බවට පත් වූ බෞද්ධ ආරාම පද්ධතියෙහි වර්ධනය මෙරට ඓතිහාසිකත්වය පිළිබඳ අධ්‍යයනයේ දී භාවිතයට ගැනෙන ප්‍රමුඛතම ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය වන මහාවංසයේ දක්වන පරිදි බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ දිනයේ දී දඹදිව ලාට රට සිට සත්සියයක පිරිසක් සමඟ විජයකුමරු මෙරටට පැමිණ තිබේ (මහාවංශය, 7-පරි, ගාථා- 1-4). මෙරට සිංහල ජාතිය ඔහුගෙන් ඇරඹි බව ද මහාවංසයෙහි දැක්වෙයි (එම, ගාථා-41,42). ඔහු සමඟ මෙරටට පැමිණි ඇමතිවරුන් මෙරට විවිධ ස්ථානවල ගම් පිහිටුවීම ද සිදු කර ඇත. ඒ අතර සිටි අනුරාධ නම් ඇමතිවරයා විසින් කොළම්හොය (මල්වතු ඔය) ඉවුරෙහි අනුරාධ නමැති ගම පිහිටුවන ලදි. එම ගම් ජනපද වශයෙන් ද හඳුන්වා තිබේ (එම, ගාථා- 43,44).

මෙම ග්‍රාමය ක්‍රමයෙන් නගරයක් දක්වා පසු අවධියක දී වර්ධනය වූ අතර එය කේන්ද්‍රකොටගෙන ඇති වූ රාජධානි සමය සමස්තයක් ලෙස අනුරාධපුර යුගය යනුවෙන් ව්‍යවහාර කෙරේ. එනිසා අනුරාධපුරය නගරයක් වශයෙන් වර්ධනය වීම සිදු වූ අයුරු දැන සිටීම සමස්ත අනුරාධපුර යුගය පිළිබඳ වටහා ගැනීමට උපකාරී වේ.

අනුරාධපුර නගරය මෙරට ඉතිහාසයේ අපට හමුවන පැරණිතම සංවිධානාත්මක නගරය වශයෙන් හැඳිනගත හැකි ය. එය මැනවින් සංවිධිත නගරයක් බවට පත් වන්නේ පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය සමයේ දී ය. එම රජු විසින් මෙම නගරය සංවිධිත නගරයක් ලෙසින් මනා සැලසුමකට අනුව ගොඩනඟන ලද ආකාරය මහාවංසයෙහි මැනවින් දක්වා තිබේ (එම, 10-පරි, ගාථා- 7-105).

මෙම නගරය මෙලෙස සංවිධිත නගරයක් ලෙස ඉදිවීම සඳහා ප්‍රාග් ඓතිහාසික හා ප්‍රොටෝ ඓතිහාසික යකඩ යුගවල දී පටන් මෙම ප්‍රදේශයෙහි සිදු වූ ජනාවාසකරණය නිසා ඇති වූ සංස්කෘතික ක්‍රියාකාරිත්වය හේතු වී ඇත. අනුරාධපුර පැරණි ඇතුළු නගරයේ ශිරාන් දැරණියගල විසින් සිදු කරන ලද පුරාවිද්‍යාත්මක අධ්‍යයනවලින් එම සංස්කෘතික ක්‍රියාකාරීත්වය හා එය සිදු වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු සමුදායක් අනාවරණය කරගෙන තිබේ. ඔහුගේ අධ්‍යයනවලට අනුව අනුරාධපුර නගරයේ ක්‍රිස්තු පූර්ව 3900 පමණ වන විට මධ්‍ය ශිලා යුගය නියෝජනය කළ මිනිසුන් වාසය කොට තිබේ. ඉන් පසු ක්‍රිස්තු පූර්ව

900 - 600 අතර කාලයේ දී පූර්ව ඓතිහාසික යකඩ යුගය නියෝජනය කළ ජනතාව මෙහි වාසය කොට තිබේ. ක්‍රිස්තු පූර්ව 600 - 500 අතර කාලයේ දී පූර්ව ඓතිහාසික යකඩ යුගයෙන් පහළ මූල ඓතිහාසික යුගයට පරිවර්තනය වන අවධියක් මෙහි පැවත තිබේ. ක්‍රිස්තු පූර්ව 500 - 250 අතර කාලයේ දී පහළ මූල ඓතිහාසික අවධිය නියෝජනය කළ මිනිසුන් සිටි සංස්කෘතික අවධියක් මෙහි වේ. ක්‍රිස්තු පූර්ව 250 - ක්‍රිස්තු වර්ෂ 100 අතර කාලයේ දී මෙහි මධ්‍ය මූල ඓතිහාසික අවධිය නියෝජනය කළ සංස්කෘතියක් පැවතී තිබේ. ක්‍රිස්තු වර්ෂ 100 - 250 අතර කාලයේ දී ඉහළ මූල ඓතිහාසික අවධියට අයත් සංස්කෘතිය නියෝජනය කළ මිනිසුන් මෙම නගරයේ වාසය කොට තිබේ. එසේ ම ක්‍රිස්තු වර්ෂ 400 දී පමණ මධ්‍ය ඓතිහාසික අවධියට අයත් සංස්කෘතිය නියෝජනය කළ මානව ක්‍රියාකාරීත්වයක් මෙහි පැවත තිබී ඇත (Deraniyagala, 1992, P:729).

කලින් කලට උදා වූ මෙම කාල පරිච්ඡේදවල පැවති සංස්කෘතික තත්ව හා තාක්ෂණික ක්‍රමවේද සෘජු ලෙස ම අනුරාධපුරය ක්‍රමක්‍රමයෙන් ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා බලපාන්නට ඇති බව ඉහත දක්වන ලද පුරාවිද්‍යාත්මක සාක්ෂි මත පදනම් ව අනුමාන කළ හැකි ය.

මෙලෙස වසර සිය ගණනක් මුළුල්ලේ ක්‍රමයෙන් සංවර්ධනය වෙමින් ආ මෙම නගරය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට බුදු දහම හඳුන්වා දෙන අවස්ථාව වන විට මෙරට අග නගරය බවට පත් ව පැවතිණි (සිංහල බෝධිවංසය, නගර ප්‍රවේශ කතාව, පි:150).

එසේ සංවර්ධනය වී පැවති මෙම නගරය කේන්ද්‍රගත ව රාජ්‍ය අනුග්‍රහය මත බුදු දහම මෙරට රාජ්‍ය ආගම බවට පත් ව රටේ සියලු දිසාවන් කරා ව්‍යාප්ත විය. එසේ බුදු දහම රට පුරා ව්‍යාප්ත වීමත් සමඟ ඇති වූ ආරාම පද්ධතිය මූලික කරගෙන මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය හැදී වැඩී පෝෂණය විය.

බුදු දහම නිත්‍ය වශයෙන් මෙරට රාජ්‍ය ආගම බවට පත් වීම මිහිඳු මහරහතන් වහන්සේගේ පැමිණීමෙන් පසු කිස්තු පූර්ව තෙවන සියවසේ දී සිදු වුව ද එයට පෙර මෙරට ක්‍රමානුකූල ව සංවිධිත වූ රාජ්‍ය හෝ ජාතික ආගමක් නොපැවතිණි (Rahula Thero, 1956, p:34). එකල සංවිධිත නො වූ ආගම්, ඇදහිලි හා විශ්වාස පද්ධතියක් පැවතිය ද (එම, පි: 34 - 36) ඒවා සංවිධිත නොවීම නිසා මිහිඳු මහ තෙරුන් වහන්සේට බුදු දහම මෙරට රාජ්‍ය ආගම බවට පත් කිරීමට පහසුවක් සැලසී තිබේ.

මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට වැඩමවන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස් හයකට පසු ව ය. මහින්දාගමනය යන්න මෙරට ඉතිහාසයේ සිදු වූ සත්‍ය සිදුවීමක් බැව් තහවුරු වන සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය ද තිබේ (අදිකාරම්, 1963, පි:101). උන් වහන්සේගේ වැඩමවීම මෙරට ඉතිහාසයේ සංස්කෘතිකමය වශයෙන් අලුත් යුගයක් අරඹන සිදුවීමක් ද වී තිබේ (එම, පි:89).

මහින්දාගමනයෙන් පසු ව මෙරට සෑම ප්‍රදේශයක ම පාහේ ඉතා ශීඝ්‍රයෙන් බුදු දහම පැතිරී ඇති බැව් ක්‍රිස්තු පූර්ව යුගය නියෝජනය කෙරෙන ලෙන්ලිපි දහස් ගණනක් සුළු ප්‍රදේශයක හැර රටේ සෑම ප්‍රදේශයක ම පාහේ විසිරී තිබීමෙන් පැහැදිලි වෙයි (Paranavithana, 1970, p:xvl). මෙම පැතිරීම එකවර ම සිදු වූවක් නො වේ. මිහිඳු මහරහතන් වහන්සේ සතු ව පැවති නායකත්ව ලක්ෂණ නිසා ම එය මෙරට රාජ්‍ය ආගම බවට පත් ව ක්‍රමයෙන් මුල්බැසගෙන ව්‍යාප්ත වූ ආකාරයක් දැකිය හැකි ය.

බුදු දහම මෙරට නිත්‍ය ලෙස ස්ථාපිත වූ පසු එහි බලපෑම නිසා එතෙක් මෙරට පැවති සංස්කෘතිය නව මුහුණුවරක් ගෙන තිබේ. ආගම, කලාව, දේශපාලනය, වාස්තු විද්‍යාව, ආර්ථික, සමාජයීය, සංස්කෘතිය ආදි සෑම අංශයකට ම එහි බලපෑම සිදු ව තිබේ. එම බලපෑම සාධනීය හා යහපත් බලපෑමක් වූ අතර එනිසා ම මෙරට සෑම අංශයක ම පාහේ ශීඝ්‍ර දියුණුවක් ද ඇති විය.

වාස්තු විද්‍යාත්මක ව විමසීමේ දී භික්ෂූන් වහන්සේලාගේ නිත්‍ය වාසය සඳහා ආරාම පද්ධතියක් ගොඩනැඟීම බුදු දහම නිසා මෙරට සංස්කෘතියට ලැබුණු සුවිශේෂී ම දායාදයක් වශයෙන් නම් කළ හැකි ය. මෙම ආරාම ආශ්‍රිත ව සිදු වූ සියලු ක්‍රියාකාරකම් මෙරට සෑම අංශයක් ම පාහේ පෝෂණය කිරීමට තරම් ප්‍රබල හේතුවක් වීම නිසා එය එසේ හැඳින්විය හැකි ය.

මෙරට ඉදි කරන ලද ආරාම පද්ධතියෙහි පළමු ආරාමය වන්නේ මහාවිහාරය යි. එය ආරම්භයේ දී තිස්සාරාමය යනුවෙන් හඳුන්වන ලද අතර මහමෙව්නා උයනෙහි එය ස්ථාපිත කොට තිබේ. ඒ ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ දී දෙවනපෑතිස් රාජ්‍ය සමයේ දී ය (කුලතුංග, 2018, පිː25). මහාවිහාරය පිහිටුවීම පිළිබඳ දීර්ඝ විස්තරයක් මහාවංශයෙහි සපයා තිබේ (මහාවංසය, පරි - 15, ගාථාː 174).

මෙසේ ඇරඹි මහාවිහාරය ඉන් පසු ව විවිධ රජවරුන්ගේ අනුග්‍රහය ඇති ව ක්‍රමක්‍රමයෙන් සංවර්ධනය වී තිබේ. පසු අවධිය වනවිට මහා විහාරයට අමතර ව අභයගිරිය කේන්ද්‍රකරගෙන හා ජේතවනය කේන්ද්‍රකරගෙන ද වෙන ම විශාල ප්‍රමාණයේ ආරාම සංකීර්ණ ඇති වී තිබේ. අනුරාධපුරයෙහි පැවති මෙම ප්‍රධාන ආරාම සංකීර්ණවලට අමතර ව දිවයිනේ බොහෝ ප්‍රදේශවල විශේෂයෙන් රුහුණු ප්‍රදේශය මුල් කරගෙන ද මෙම අවධියේ දී මහා පරිමාණ ආරාම සංකීර්ණ ඇති වී තිබේ.

මෙසේ දිවයින පුරා ඉදි වූ ආරාම සංකීර්ණවල විවිධ උපයෝගිතාවන් සඳහා අදාළ වන වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් සමුදායක් ද ගොඩනැඟිණි. එහි දී පිළිම ගෙවල්, ථූපඝර, බෝධිඝර, දානශාලා, සන්නිපාත ශාලා, ජන්තාඝර, ලැගුම් ගෙවල්, කැසිකිළි, වැසිකිළි, ආදිය ප්‍රමුඛ වී තිබේ. මෙම අංගවලින් සමන්විත ආරාම සංකීර්ණ ක්‍රමයෙන් අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත් ව පිරිවෙන් වශයෙන් හඳුන්වන විශේෂ ආයතන සමුදායක් ද මෙම ආරාම සංකීර්ණවල ගොඩනැඟී ඇත.

**පැරණි අධ්‍යාපනයෙහි ස්වරූපය**

මෙරටට අයත් සිංහල ශිෂ්ටාචාරය එහි ආරම්භයේ සිට ම පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය වීම සඳහා බලපාන ලද කාරණා අතර අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි ව තිබෙන බැව් සිතිය හැකි ය. ඒ එහි ආරම්භයේ සිට ම අධ්‍යාපන ක්‍රියාවලියක් පැවති බැවිණි. ඒ පිළිබඳ ව යම් කාරණා මහාවංසයෙහි ඇතුළත් ව තිබීමෙන් එය තහවුරු කරගත හැකි ය. එහි පණ්ඩුකාභය රජුගේ ප්‍රවෘත්ති දැක්වෙන විට ඔහුට ශිල්පය ඉගැන්වූ ආචාර්යවරයකු පිළිබඳ දක්වා තිබීම ඒ සඳහා උදාහරණයකි (මහාවංසය, පරි-10, ගාථා- 23).

මෙරට සිංහල ශිෂ්ටාචාරය ක්‍රමයෙන් වර්ධනය වත් ම රට වැසියන් අධ්‍යාපන ක්‍රමයක් අනුගමනය කොට තිබේ. එහි දී අක්ෂර මාලාවක් නිර්මාණය කර ගැනීම ද විශේෂ ය. අක්ෂර භාවිතයට හුරු වීමත් සමඟ එතෙක් මුඛ පරම්පරාගත ව පවත්වාගෙන පැමිණි දෑ හා අදහස් ලියාදැක්වීම ආරම්භ කොට ඇත. ආරම්භයේ දී අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ ව මෙම කටයුතු සිදුකොට ඇත්තේ බ්‍රාහ්මණ වංශිකයන් ය (විජේසේකර, 1987, පිː101-102).

මෙරට අක්ෂර භාවිතයෙහි ඉතිහාසය පුරාවිද්‍යා මූලාශ්‍රය මඟින් තහවුරු වන පරිදි ක්‍රි: පූ: 6-5 පමණ සියවස් දක්වා අතීතයට විහිදෙන අතර විජය හා පණ්ඩුකාභය පුරාවෘත්ත පිළිබඳ ව වංසකථාවල දැක්වෙන තතු අනුව එම කරුණ එම කාලයට අයත් බැව් සාහිත්‍යය මූලාශ්‍රයවලින් ද තහවුරු වෙයි.

මෙරට අක්ෂර භාවිතයෙහි ඉතිහාසය පිළිබඳ අදහස් දක්වන ඇතැම් පිරිස්හි අදහස වන්නේ මහින්දාගමනයත් සමඟ මෙරටට අක්ෂර කලාව පැමිණි බව ය (ධර්මකීර්ති හිමි, 1991, පි:66).

මෙම අදහස සාවද්‍ය අදහසක් බව දැනට සිදු කෙරී ඇති පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් තහවුරු වී තිබේ. ශිරාන් දැරණියගල අනුරාධපුර ඇතුළු නගරයේ සිදු කර ඇති පර්යේෂණ මඟින් හා තුසිත මැන්දිස් සිදුකර ඇති අන්දරවැව මෙගලිතික ශිලා සුසාන කැණීම ඇසුරින් ඒ බව තහවුරු වී තිබේ. දැරණියගලගේ පර්යේෂණවලින් තහවුරුවන පරිදි මෙරට අක්ෂර භාවිතයේ ආරම්භය ක්‍රි:පූ 6-5 සියවස් කාලයට අයත්වන අතර මැන්දිස්ගේ පර්යේෂණවලින් ලැබී ඇති අක්ෂර භාවිතය පිළිබඳ තොරතුරු ක්‍රි:ව 6 වන සියවසට අයත්ය (DERANIYAGALA, 1992, P:741,742,743) (මැන්දිස්, 2019, පි:251).

මෙරට පැරණි අධ්‍යාපන ක්‍රියාවලියේ දී ලේඛන කටයුතු සඳහා දීර්ඝ කාලයක් බ්‍රාහ්මී අක්ෂර යනුවෙන් හඳුන්වන මෙම අක්ෂර භාවිත වුව ද මිහිඳු හිමියන්ගේ ආගමනයත් සමඟ එතෙක් පැවති අක්ෂර කලාවෙහි ද යම් යම් වෙනස්කම් සිදු ව ඇති බව සිතිය හැකි ය. එතෙක් මැටි පුවරු මත සුළු වශයෙන් සටහන්කොට පැවති අක්ෂර භාවිතය වෙනුවට වානේ තාක්ෂණයට හුරු වීමත් සමඟ ශිලා මතුපිට යම් යම් විශේෂ කරුණු විශේෂයෙන් භික්ෂූන් වහන්සේ වෙත හා විහාරස්ථාන වෙත සිදු කරන ලද විවිධ පූජා පිළිබඳ විස්තර වැඩි වශයෙන් සටහන් කිරීමට පෙලඹී තිබෙන බවක් දැනට හමු වී ඇති දහස් ගණනක් වන ශිලාලේඛන ඇසුරින් ගම්‍ය වේ.

බුදු දහම මෙරට රාජ්‍ය ආගම බවට පත් ව රට වැසියාගෙන් අති බහුතරය බුදු දහම අනුගමනය කිරීමට පෙලඹීමත් සමඟ එතෙක් බ්‍රාහ්මණයන් යටතේ පැවති අධ්‍යාපන ක්‍රියාවලිය භික්ෂූන් වහන්සේලා වෙත විතැන් විය. ආරම්භයේ දී මෙම කටයුතුවල ප්‍රමුඛයන් වූයේ මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේලා ය (විජේසේකර, 1987, පි:102). ආරම්භයේ දී ථෙරවාදී බුදු දහම පමණක් මෙරට පැවතිය ද පසු අවධිය වන විට මහා මහායාන බුදුසමය පැමිණි නිසා එහි ආභාසය ලද අභයගිරි හා ජේතවන විහාර සංකීර්ණ පදනම් කොටගෙන ද අධ්‍යාපන ආයතන ගොඩනැඟී තිබේ. එනිසා මහායාන අදහස් දරන ලද භික්ෂූන් වහන්සේලා ද මෙරට අධ්‍යාපන ක්‍රියාවලියෙහි නිරත ව සිට ඇත.

බොහෝ විට පොදු වශයෙන් ශිල්ප ශාස්ත්‍ර උගන්වන ස්ථානය වූයේ විහාරස්ථාන ය. ප්‍රභූ පිරිස්හි දරුවන් මෙන් ම සාමාන්‍ය වැසියන්ගේ දරුවන් ද ශිල්ප ලබාගනු ලැබූයේ විහාර ආශ්‍රිත ව පැවති මෙම අධ්‍යාපන මධ්‍යස්ථානයන්ගෙනි. සංඝතිස්ස, සංඝබෝධි, ගෝඨාභය, මහසෙන්, දෙටුතිස්, ධාතුසේන ආදි රජවරුන් කුමාර අවධියේ දී අධ්‍යාපනය ලබා ඇත්තේ විහාරස්ථාන වෙතින් බව ඉතිහාස ග්‍රන්ථවල දැක්වී තිබීමෙන් ඒ බව පැහැදිලි වේ (ධර්මකීර්ති හිමි, 1991, පි:67).

මෙසේ භික්ෂූන් අත පැවැති අධ්‍යාපන ක්‍රියාවලියේහි දී භාෂා මාධ්‍ය කිහිපයක් ම භාවිත කෙරී තිබේ. මහාවිහාරයීය භික්ෂූන් වහන්සේලා සිය භාෂා මාධ්‍යය ලෙස පාලි භාෂාව භාවිත කොට ඇති අතර අභයගිරිය මූලික කොටගත් මහායාන ආභාසය සහිත භික්ෂූන් වහන්සේ සංස්කෘත භාෂාව සිය මාධ්‍යය ලෙස භාවිත කළහ.

මෙම භාෂා මාධ්‍ය දෙක පැවැතිය ද මෙකල සිංහල භාෂාව පොදු භාෂා මාධ්‍යය ලෙස භාවිතකොට ඇති බැව් ක්‍රි:ව 5 වන සියවස පමණ දී බුද්ධඝෝෂ හා ධම්මපාල වැනි තෙරවරුන් විසින් එතෙක් හෙළ බසින් පැවති ග්‍රන්ථ පාලි බසට පෙරළීමෙන් පෙනී යයි.

බුදු දහමට අදාළ ඉගැන්වීම් මෙසේ භික්ෂූන් වහන්සේලා විසින් සිදුකළ ද ගිහි ජීවිතයට අදාළ ඇතැම් ඉගැන්වීම් ගිහි ආචාර්යවරුන් විසින් ද සිදු කොට තිබේ. විහාරස්ථාන ආශ්‍රිත ව පැවති මෙම අධ්‍යාපන මධ්‍යස්ථාන ආචාර්ය-ශිෂ්‍ය පරම්පරාවෙන් පැවත ආ අතර පසු අවධියේ දී මෙම ආයතන මූල හෝ පිරිවෙණ යනුවෙන් හඳුන්වා ඇත (විජේසේකර, 1987, පි:102).

### අනුරාධපුර යුගයේ පැවති පිරිවෙන් අධ්‍යාපනය

පිරිවෙන් අධ්‍යාපනය ඉතා ඈත අතීතයේ සිට ම වර්තමානය දක්වා පැවතෙන්නකි. එහි ආරම්භයේ සිට වර්තමානය කරා පැමිණීමේ දී කලින් කලට විවිධ වෙනස්කම් ද සිදු ව තිබේ. යටත් විජිත යුගයේ දී ඉංග්‍රීසි ජාතික පාලකයන් විසින් වත්මනේ දී ක්‍රියාත්මක පාසල් පද්ධතිය ඇති කිරීමට පළමු ව මෙරට අධ්‍යාපන ක්‍රියාවලිය සිදු වූයේ පන්සල මූලික කරගෙන පැවති පිරිවෙන් ආශ්‍රිත ව ය. පිරිවෙන යන වචනයෙන් මුල් අවස්ථාවෙහි අදහස් කොට ඇත්තේ උභතෝ සංඝයා ගේ වාසස්ථාන ය. පසු ව ඒවා අධ්‍යාපන මධ්‍යස්ථාන බවට පත් ව තිබේ.

පිරිවෙන යනු විහාර සංකීර්ණයක් තුළ පැවති අවශේෂ අංගයකි. එය විහාර භූමිය තුළ ම පවුරු ආදියෙන් වට කොට ස්ථාපිත කරනු ලබන්නකි. මෙරට පැවැති මහාවිහාරය, අභයගිරිය, ජේතවනය ආදි විහාර සංකීර්ණයේ මෙන් ම භාරතයේ වික්‍රමශිලා ආදී විහාරවල ද මෙවැනි පිරිවෙන් පැවති අතර ඒවා අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙසින් ක්‍රියාත්මක ව ඇත. මෙවන් විහාර සංකීර්ණ ආශ්‍රිත ව පැවැති අධ්‍යාපන ආයතන දෙස බැලීමේ දී පෙනී යන්නේ ප්‍රබල හා දියුණු විහාර ආශ්‍රිත ව පැවැති අධ්‍යාපන ආයතන වත්මන් විශ්වවිද්‍යාල මට්ටමින් ක්‍රියාත්මක ව පැවති බව ය (විමලවංශසූරිය, 2001, පි:28,29).

පරමත්ථදීපනී අටුවාවෙහි ''පරිච්ඡෙද-වසෙන වෙදිතබ්බතො පෙක්ඛිතබ්බතො පරිවෙණං පාසාධ කූඨාගාර රත්තිට්ඨානාදී සම්පන්නං පාකාර පරිච්ඡින්නං ද්වාර කොට්ඨක යුත්තං ආවාසං අකංසු'' (එම, පි:29). යන්නෙන් විහාර තුළ ම පිරිවෙන් පැවති බව තහවුරු වෙයි.

පිරිවෙන් යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආයතන ඉතා දිගු ඉතිහාසයකට හිමිකම් කියන ආයතන විශේෂයකි. ආරම්භයේ දී එක් භික්ෂූන් වහන්සේ නමක් හෝ දෙතුන් නමක් වැඩසිටි කුඩා කුටි විශේෂයක් මෙනමින් හඳුන්වා ඇති බවට අනුමාන ඇත. මිහිඳු මහ තෙරුන්වහන්සේ වැඩසිටි අවධියේ පැවති කාළපාසාද, මරුගන, දීඝචංකමන, ඵලග්ග ආදි පිරිවෙන් මෙවැනි කුඩා ප්‍රමාණයේ කුටි විශේෂයක් බව හා මෙවැනි කුඩා ප්‍රමාණයේ පිරිවෙන් එකතු වී මහා විද්‍යාස්ථානයක් බිහි වූ බවට ද අදහසක් පතී (ධර්මකීර්ති හිමි, 1991, පි:67).

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමවල පවත්වා ගෙන යන ලද අධ්‍යාපන ආයතන විශේෂයක් ව පැවති පිරිවෙන්වල ප්‍රධාන වශයෙන් ශාසනයේ පැවැත්මට ආධාරවන අධ්‍යාපනයක් ලබාදීමත්, ඒ සඳහා පිරිස පුහුණු කිරීමත් කෙරෙහි වැඩි අවධානය යොමු කොට තිබී ඇත. එහි දී භික්ෂූන් වහන්සේලාට මෙන් ම ගිහි පිරිසට ද එම ආයතනවල එයට අදාළ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමි කොට දී තිබේ (විමලවංශසූරිය, 2001, පි:28).

අනුරපුර යුගයේ දී මෙරට ප්‍රධාන විහාර සංකීර්ණවල ඉදිකොට පැවති පිරිවෙන්

විශාල ප්‍රමාණයක් පිළිබඳ ව සාහිත්‍යය හා ශිලා ලේඛන මූලාශ්‍රයන් මඟින් තතු හැදෑරිය හැකි ය. එම පිරිවෙන් අතර කාලපාසාද, සුනහාත, දීඝචංකමන, එලග්ග, මරුගන, දීඝසන්ධසේනාධිපති, පුද, කට්ඨහාල, මයූර, දූරසංඛර, ග්‍රන්ථාකර, ජත්තවඩ්ඪි ආදි පිරිවෙන් මහාවිහාරය කේන්ද්‍රකොටගෙන පැවැතිණි. එසේ ම අභයගිරි විහාරයේ ද කපුරු පිරිවෙන, උතුරොල පිරිවෙන ආදි පිරිවෙන් 12ක් ද පැවතිණි. අනුරාධපුර නගරයෙන් පරිබාහිර ව පැවති තිස්සමහාරාමය, සිතුල්පව්ව වැනි ස්ථානවල ද මෙලෙස පිරිවෙන් ආශ්‍රිත ව ආධ්‍යාපනික මධ්‍යස්ථාන ක්‍රියාත්මක ව පැවැත තිබී ඇත (එම, පි:29,30).

ආරම්භයේ දී පිරිවෙන්වල ත්‍රිපිටකය වාචෝත්ග්‍රහණය කොට පවත්වාගෙන යාමත්, අට්ඨකථා ආදිය මාර්ගයෙන් අර්ථ විමසීම් ආදියත් සිදුකොට තිබේ. තෙපිටක හා භාණක යන විශේෂ නාමයන්ගෙන් හඳුන්වන ලද භික්ෂු පිරිස විසින් පිරිවෙන්වල වැඩ සිටිමින් මෙම කටයුත්ත සිදු කොට තිබේ. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසු ව මෙම පිරිසේ කාර්යභාරය වෙනසකට ලක්ව ත්‍රිපිටකය පොත්වල ලියමින් ඉදිරියට පවත්වාගෙන යාම සිදු කොට ඇති බව සිතිය හැකි ය. එමෙන් ම ත්‍රිපිටකයේ ඇතුළත් ධර්ම කරුණු විග්‍රහ කිරීම සඳහා අටුවා, ටීකා, සන්න ආදි කෘති සම්පාදනය කිරීමේ කටයුත්ත ද මෙම අධ්‍යාපන ආයතන තුළ සිදු ව තිබේ (එම, පි:30).

### අධ්‍යාපන මධ්‍යස්ථානවල පැවති විෂය මාලා හා සිසුන්

ක්‍රි:ව: පළමු සියවස පමණ වන විට ඉන්දියාවේ පෘථුල වශයෙන් ආගමික හා සංස්කෘතික නව ප්‍රබෝධයක් ඇති විය. එහි දී ඒ වන විට පෙරදිග හා අපරදිග ව්‍යාප්ත ව පැවති ජාති, ආගම්, දර්ශන ආදියෙහි සම්මිශ්‍රණය නිසා ඉන්දියාවෙහි ආගම්, දර්ශන, සාහිත්‍ය හා කලා යන සියලු ක්ෂේත්‍රවල නව ප්‍රබෝධයක් ඇති විය. මෙම ක්‍රියාවලියෙහි ප්‍රමුඛයන් වූයේ බෞද්ධ ආචාර්යවරු ය. එනිසා ම නිකාය භේදය තව දුරටත් පුළුල් වූ අතර එම යුගයේ පැවැති අධ්‍යාපන ආයතන පදනම් කොට ගෙන බුදු දහම අරබයා නව අදහස් හා න්‍යායන් ඔවුන් වෙතින් එළිදැක්විණි. එහි දී බුදු දහම විවිධ භාෂා, කාව්‍ය, නාට්‍ය, න්‍යාය ආදි දේ ඇතුළත් කෙරිණි. මෙහි ඵලයක් ලෙස ආරාමික අධ්‍යාපන ආයතනවල පැවති විෂය පරාසයෙහි පුළුල් වීමක් ද සිදු වූ අතර එය මෙරට පැවති ආරාමික අධ්‍යාපන ආයතනවලට ද බලපා තිබේ (ජයවීර, 1996, පි:37) ( විමලවංශසූර්ය, 2001, පි:30).

අනුරාධපුර යුගයේ එක් සමයක දී විශේෂයෙන් මහායාන බුදු සමයේ බලපෑමත් සමඟ මෙරට පැවැති අධ්‍යාපන ක්‍රියාවලියේ දී භාවිත කරන ලද භාෂා අතර සංස්කෘත භාෂාව සඳහා යම් විශේෂ බවක් ලැබී තිබේ. දෙවන සේන රජුගේ සියබස්ලකර කෘතිය සඳහා දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයේ බලපෑමෙන් සංස්කෘත ආභාසය ඇති අතර බුද්ධදාස රජුගේ සාරාර්ථ සංග්‍රහය, කුමාරදාස රජුගේ ජානකීහරණය වැනි කෘති ලියැවී ඇත්තේ සංස්කෘත භාෂාවෙනි. එවැනි භාෂා හැරුණුකොට ව්‍යාකරණ, ඡන්දස්, අලංකාර, නිරුක්ති, තර්ක න්‍යාය, ඉතිහාසය, වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යෝතිශාස්ත්‍රය, යන්ත්‍ර, මන්ත්‍ර ආදි දේ හා කලා ශිල්ප ආදිය ද මෙම ආයතනවල උගන්වන ලද විෂයමාලාවෙහි තිබී ඇත (ජයවීර, 1996, පි:38,39).

මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල ඉගෙනුම ලැබූ පිරිස් අතර ශාසනය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිසට ධර්ම ඥානය ලබා දී පුහුණු කොට ඇත. මේවායෙහි අධ්‍යාපනය ලද පිරිසෙහි විවිධත්වය නිසා ම ජන දිවියේ ලෞකිකත්වයට අදාළ විෂයය

ඉගැන්වීම්වලින් ඒ සඳහා අවැසි දැනුම ද ලබා දී තිබේ. මේවායෙහි පැවති විශේෂත්වය වන්නේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව පැවිදි පක්ෂයට පමණක් සීමා නො වීම යි. ජෙට්ඨතිස්ස රජුගේ බිසව අභිධර්මය ඉගෙනීම, වෝහාරිකතිස්ස රජු දේව නම් තෙරුන් වහන්සේ නමකගෙන් ත්‍රිපිටකය ඉගෙනීම, කපිල නම් අමාත්‍යවරයා වෛතුල්‍යවාදය හා ථෙරවාද දහම නොගැළපෙන බව විනිශ්චය කිරීමට තරම් පඬිවරයෙකු වීම, දායෝපභූති නම් අමාත්‍යවරයා හා ජෝතිපාල නම් තෙරුන් වහන්සේ අතර ඇති වූ සංවාදය, ආදි සිදුවීම්වලින් පෙනී යන්නේ මෙම අධ්‍යාපන මධ්‍යස්ථානවල ගිහි පැවිදි දෙපිරිස ම උගත් බව ය (විමලවංශසූරිය, 2001, පි:31).

මෙම අධ්‍යාපන ආයතනවල උගන්වන ලද දේ ආගමික ඉගැන්වීම්වලට පමණක් සීමා නො වුණි. රාජ නීතිය වැනි දේ ඉගැන්වීම මගින් රාජකුමාරවරුන් රාජ්‍යත්වයට අවැසි ඥානයෙන් හා කුසලතාවලින් පෝෂණය කළ බැව් ධාතුසේන, සංඝබෝධි වැනි රජවරුන්ගේ කතා පුවත් විමැසීමෙන් පෙනීයයි. මෙම ආයතන ප්‍රභූ පන්තියට ම සීමාවී නො පැවතිණි. මහාවිහාරය, අභයගිරිය, ජේතවනය ආදි අධ්‍යාපන මධ්‍යස්ථාන වෙත විදේශීය ශිෂ්‍යයන් පැමිණීමෙන් මෙම ආයතන එවක ජාත්‍යන්තර කීර්තියට පත් විශ්වවිද්‍යාල මට්ටමින් ක්‍රියාත්මකව තිබී ඇති බව පෙනීයයි (ජයවීර, 1996, පි:83,84: විමලවංශසූරිය, 2001, පි:32).

**සමාලෝචනය**

මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලියේ ආරම්භය සිදු වූ අනුරාධපුර යුගයේ දී පැවති අධ්‍යාපන ක්‍රියාවලයේ විවිධතා පිරික්සීමේ දී මහාවිහාරය, අභයගිරිය හා ජේතවනය ආදි විහාර සංකීර්ණ පදනම් කරගෙන ඇති වූ පිරිවෙන් ආශ්‍රිත ව එම අධ්‍යාපන ක්‍රියාවලිය සංවිධිත අයුරින් දීර්ඝ කාලයක් පුරාවට එනම් ක්‍රි:පූ තෙවන සියවසේ සිට ක්‍රි:ව: එකළොස්වන සියවස දක්වා ම ක්‍රියාත්මක ව පැවති බවක් දැකිය හැකි ය.

මෙම අධ්‍යාපන ක්‍රියාවලියේ ආචාර්යවරුන් වශයෙන් වැඩි වශයෙන් ක්‍රියාකොට ඇත්තේ භික්ෂූන් වහන්සේලා ය. ඇතැම් ලෞකික විෂයන් ඉගැන්වීමේ දී ගිහි පිරිස් ආචාර්යවරුන් වශයෙන් ක්‍රියාකොට තිබේ. ඇතැම් අවස්ථාවල දී ඉගැන්වීමේ කටයුතුවල නිරත ව සිටි මෙම ආචාර්වයරුන් වෙත විවිධ ආකාරයෙන් ගෙවීම් සිදු කොට පැවති බව ද ශිලාලේඛන විමසීමෙන් පෙනී යයි.

මෙම අධ්‍යාපන ක්‍රියාවලියේ පැවති විෂය නිර්දේශය ලෝකෝත්තර හා ලෞකික යන උභය ජීවිත සාර්ථක කරගැනීම සඳහා සම්මිශ්‍රණයකින් යුතු ව නිර්මාණය වී පැවති බැව් ඒ පිළිබඳ විමසීමේ දී පැහැදිලි ව පෙනීයයි. එම විෂයන් අධ්‍යාපන මධ්‍යස්ථානවල මෙන් ම පාරම්පරිකව සිය නිවෙස්වල ද ඉගෙනීමට අවකාශ තිබී ඇති බවක් පෙනේ.

මෙසේ අනුරාධපුර යුගයේ දී ආරම්භ වී වර්ධනය වූ මෙරට සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය කාලයත් සමඟ විවිධ වෙනස්කම්වලට ලක් වෙමින් වසර දෙදහසකටත් වැඩි කාලයක් දක්වා එනම් මෙරට අවසන් රාජධානි සමය වූ මහනුවර රාජධානි සමයේ දී ඉංග්‍රීසීන්ට යටත්වන අවස්ථාව දක්වා ම ක්‍රියාත්මක වූවක් වශයෙන් ද හැඳිනගත හැකි ව තිබේ.

වර්තමානයේ දී අප රටෙහි පවතින්නේ විදේශීය රටවල ක්‍රියාත්මක අධ්‍යාපන ක්‍රමවේද පාදක කරගත් ආධ්‍යාපනික රටාවකි. එහි ප්‍රමුඛ අවධානය යොමු ව ඇත්තේ ආර්ථික අරමුණු සාධනය කරගැනීම ය. එම අරමුණ ඇති ව අධ්‍යාපන ක්‍රමවේද සකසා ඇති බැවින් පැරණි සමයෙහි දැකගත හැකි ව පැවති සමාජ සාදාරණත්වය හා සාරධර්ම වත්මන් සමාජයෙන් ක්‍රමයෙන් දුරස් ව ඇති බැව් පෙනී යයි. එනිසා

පැරණි සම්භාව්‍ය අධ්‍යාපන රටාවෙහි වූ යහපත්කම් හැඳිනගෙන වර්තමාන සමාජය වඩා හිතකර සමාජයක් බවට පත් කරගැනීම සඳහා නව ආධ්‍යාපනික ක්‍රමවේද සකසා ගත යුතු ව තිබේ. ඒ සඳහා ආදර්ශ පැරණි ආධ්‍යාපනික ක්‍රම ඇසුරින් හදාළ හැකි ව තිබේ.

**මූලාශ්‍රය**


අදිකාරම්, ඊ.ඩබ්. (1963) *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කුලතුංග, ටී.ජී, (2018) *අනුරාධපුර මහාවිහාරය*, නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, වී.ඩී.එස්, (1998), සංස් *සිංහල බෝධි වංසය*, කොළඹඃ සමයවර්ධන මුද්‍රණාලය.

ජයවීර, ඒ.එම්.එස්, (1996), *ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විෂය මාලාව*, මහරගමඃ කර්තෘ ප්‍රකාශන, තරංජී ප්‍රින්ට්ස්.

ධර්මකීර්ති හිමි, එන්. (1991), *ලක්දිව බුදුසසුන හා මහ සඟ පරපුර*, කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

මැන්දිස්, ටී, ඩී. (2019). *මධ්‍ය දැදුරු ඔය හා මී ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව*, මිහින්තලේඃ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

විජේසේකර, එන්. (1987), *තෝරාගත් ලිපි සංග්‍රහය*, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

විමලවංශසූර්ය, අයි.බී, (2001), *පිරිවෙන් අධ්‍යාපන ලිපි,* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සුමංගල හිමි, එච්. සහ බටුවන්තුඩාවේ, (2006), සංස් *මහාවංශය*, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

Deraniyagala, S.u, (1992), *The Prehistory of Sri Lanka – Part- Ii*, Colombo: Department of Archaeology.

Paranavitana, S, (1970), *Inscrition of Ceylon – Volume I*, Colombo: Department of Archaeology.

Rahula Thero, Walpola, (1956), *History of Buddhism in Ceylon*, Dehiwala: The Buddhist Cultural Centre.